# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2145/25 - 2019 ඔක්තෝබර් මස 15 වැනි අඟහරුවාදා - 2019.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 2017/06.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*:
4-3/6/2016/එච්ඩබ්/242.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 333 - උඩුව නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කඩවැද්දුම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් සකස් කරන ලද මූලික පිඹුරු අංක මාර 2786 හා 2019.07.12 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 05 (කැබලි 05) දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0211 ක් වූ කැබලි:

01. කැබලි අංක 1
ඉඩමේ නම: දොම්බගහකොරටුව; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: යටියන, කඩවැද්දුම, නිසංසල හි පදිංචි ඒ.සී. සෙනරත් යාපා (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0026.

02. කැබලි අංක 2
ඉඩමේ නම: පරගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සී. ඩබ්ලිව්. ජයසේකර (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0028.

03. කැබලි අංක 3
ඉඩමේ නම: පරගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: යටියන, කඩවැද්දුම, වලව්ව හි පදිංචි එස්. ඒ. නිහාල් (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0083.

04. කැබලි අංක 4
ඉඩමේ නම: කෝපිවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: යටියන,

1A - G 31263 - 32 (2019/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කඩවැද්දුම, කුසුම් සෙවන හි පදිංචි අයි. ජයතුංග ආරච්චි (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0020.

05. කැබලි අංක 5

ඉඩමේ නම: කෝපිවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: යටියන, කඩවැද්දුම, කෝපිවත්ත හි පදිංචි නන්දතිලක කෝරළගේ සහ නන්දන කෝරළගේ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0054.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.11.14 වැනි දින පෙ.ව.10.00 ට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019.11.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

උමේෂා සුරංගි මාතරගේ,
ප්‍රාදේශීය ලේකම් හා
අත්කර ගැනීමේ නිලධාරී,
තිහගොඩ.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-49

## ශුද්ධිපත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :කේආර්පී/එල්එන්ඩී/ඒසීකිවුVI/01/25-V.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/6/2015/එච්ඩබ්ලිව්/289.

මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් විසින් අංක 1987/61 හා 2016.10.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයේ සඳහන් මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වලකන්ද ගමේ, වලකන්ද බටහිර (327), වලකන්ද නැගෙනහිර (327බී) සහ වලකන්ද දකුණ (327 සී) ග්‍රාම නිලධාරි වසමේ ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2688 හා 2016.09.14 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 160 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 10.0710 ක් වූ ඉඩම් කොටස් 132 ට අමතරව එම පිඹුරේම පහත දැක්වෙන ඉඩම් කොටස ද ඇතුළත් විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

01. කැබලි අංක 157

ඉඩමේ නම: මහලෙන්කනත්ත; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ඒ. ජයවර්ධන, 'මානෙල්', පුහුල්වැල්ල, කිරින්ද; ප්‍රමාණය: හෙක්. 0.0019.

ආර්. එස්. එල්. චින්තක අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
කිරින්ද - පුහුල්වැල්ල.

2019 ඔක්තෝබර් මස 04 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
කිරින්ද - පුහුල්වැල්ල.

11-50

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.